රුහුණ විශ්වවිද්‍යාලය
றுஹுணு பல்கலைக்கழகம்
UNIVERSITY OF RUHUNA

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය
தொலை மற்றும் தொடர் கல்வி அலகு
Distance and Continuing Education Unit
වැල්ලමඩම මාතර 81000 ශ්‍රී ලංකාව வெல்லமடம மாத்தறை 81000 இலங்கை WELLAMADAMA, MATARA 81000 SRI LANKA

මගේ අංකය
எனது எண்
My No. }

ඔබේ අංකය
உங்களது எண்
Your No. }

2023.12.05

උපාධිලාභීන් වෙතයි

ගෞරවණීය ස්වාමීන්වහන්ස/ මහතමයාණෙනි/ මෙනවියනි

## උපාධි ප්‍රදානෝත්සවය - 2023

රුහුණ විශ්වවිද්‍යාලයේ 2023 වර්ෂයේ දී පවත්වනු ලබන උපාධි ප්‍රදානෝත්සවය 2023 දෙසැම්බර් 14 සහ 15 වන දින රුහුණ විශ්වවිද්‍යාලයීය රබීන්ද්‍රනාත් තාගෝර් අනුස්මරණ ශ්‍රවණාගාරයේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත. 2022/2023 අධ්‍යයන වර්ෂයන්හි දී ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධිය සම්පූර්ණ කරන ලද උපාධිලාභීන් වෙත උපාධි පිරිනැමීම පහත සඳහන් වේලාවට ආරම්භ වීමට නියමිතය.

| | |
|---|---|
| දිනය | : 2023.12.15 |
| සැසි අංකය | : 6 වන සැසිය |
| වේලාව | : ප.ව. 4.30 |

එදින පස්වරු 3.00 ට උපාධිලාභීන්ගේ පෙරහැර ආරම්භ කරන රබීන්ද්‍රනාත් තාගෝර් අනුස්මරණ ශ්‍රවණාගාරය ඉදිරිපිට ඔබ වෙත ලබා දී **අනුක්‍රමික අංකයේ අනුපිළිවෙලට** පෙළ ගැසිය යුතු ය. උපාධිලාභීන්ගේ පෙරහැර ආරම්භ වූවාට පසු පැමිණෙන කිසිවෙකු උපාධි ප්‍රදානෝත්සවය සඳහා උත්සව ශාලාවට ඇතුළත් කර ගනු නො ලැබේ.

**01.** උපාධි ප්‍රදානෝත්සවය අදාල දැනුවත් කිරීම

උපාධිලාභීන් උපාධිප්‍රදානෝත්සවයේ දී හැසිරිය යුතු ආකාරය දැනුවත් කිරීම සඳහා පවත්වනු ලබන පූර්ව පෙරහුරු වැඩසටහන 2023.12.12 දින ප.ව. 7.00 ට ZOOM තාක්ෂණය ඔස්සේ පැවැත්වේ. අදාල ඒ සඳහා පහත සබැඳිය භාවිතා කර නියමිත වේලවට සහභාගී විය යුතුය.
https://learn.zoom.us/j/94876426322?pwd=ajc1bm1iM3l1SGY1Z2JiaERkZFVvQT09

**02.** උපාධි ප්‍රදානෝත්සවයට සහභාගී වන ආකාරය

උපාධිලාභී භික්ෂූන් වහන්සේලා උපාධි ලෝගු නොපළඳින අතර, ස්වකීය අනන්‍යතාවය තහවුරු කර උපාධි පෙරහැරට සහ උපාධි ප්‍රදානෝත්සවයට සහභාගී විය හැකිය.

උපාධි ප්‍රදානෝත්සවයට සහභාගී වන පිරිමි උපාධිලාභීන් ජාතික ඇඳුමින් හෝ සම්පූර්ණ යුරෝපීය ඇඳුමින් සැරසී සිටිය යුතුය. කාන්තා උපාධිලාභීන් පෙරදිග සිරිතට අනුව විචිත්‍ර වර්ණයෙන් හා උත්සව විලාශයෙන් සාරියක්/ඔසරියෙන් සැරසී පැමිණිය යුතුය. ඔබ වෙත ලබා දී ඇති අනුක්‍රමික අංකය උපාධි කබායේ වම්පස ඇමිණිය යුතු වේ.

**03.** **ප්‍රවේශපත් නිකුත් කිරීම**

සෑම උපාධිලාභියෙකුටම උපාධි ප්‍රදානෝත්සවය සඳහා තමන්ගේ අමුත්තන් දෙදෙනෙකුගේ උපරිමයකට යටත්ව කැඳවාගෙන ඒමට හැකිවන පරිදි ප්‍රවේශපත් නිකුත් කිරීමට කටයුතු කරන අතර, උපාධිලෝගු ලබා ගන්නා අවස්ථාවේ දී එම ප්‍රවේශපත් නිකුත් කිරීමට කටයුතු යොදා ඇත. එම ප්‍රවේශපත්‍ර හිමි අමුත්තන් සඳහා රබින්ද්‍රනාත්තාගෝර් ශාලාව ඇතුලත උපාධි ප්‍රදානෝත්සවය නැරඹීමට සහභාගීවිය හැක.

ඊට අමතරව අනෙකුත් අමුත්තන්හට ගණිත අධ්‍යයානාංශයේ LT 01 සහ LT 02 ශාලා වෙත පැමිණ උපාධි ප්‍රදානෝත්සවය නැරඹිය හැක. (අදාල ශාලා වෙත ආරක්ෂක අංශය විසින් යොමු කරනු ලැබේ.)

**04.** **උපාධි ලෝගු හා මාල ආපසු බාර දීම සහ සහතික නිකුත් කිරීම**

උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වෙන දිනයේ දී හෝ උපාධි ප්‍රදානෝත්සවය නිම වී සති දෙකක් ඇතුළත උපාධි ලෝගුව, මාලය සහ හිස්වැසුම දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයට බාර දී අදාළ රිසිට්පත ලබා ගත යුතු අතර, එම කාලසීමාව ඉකුත් වීමෙන් අනතුරුව ප්‍රමාද වන සෑම දිනයක් සඳහා ම දිනකට රු.250/- බැගින් වන ප්‍රමාද ගාස්තුවක් ගෙවිය යුතු වේ. තව ද ඒවා ඔබ බාරයේ තිබියදී යම් අලාභයක් හෝ හානියක් සිදු වී ඇත්නම් ඒවායේ සම්පූර්ණ වටිනාකම හා ඊට අතිරේකව එම වටිනාකමින් 25%ක ගාස්තුවක් ද ගෙවීමට සිදුවනු ඇත.

සැ.යු. : අයදුම්පත ලෝගු මාලා ලබා දීමේදී ලබා ගත් අයදුම්පතහි අදාල කොටස වේ. ලෝගු මාල හිස්වැසුම් බාරදීමෙන් පසු විශ්වවිද්‍යාලය විසින් නැවත ගෙවන ගාස්තුව ලබාදුන් ගිණුමට බැර කරනු ලැබේ.

(සහභාගී වූ සිසුන් සඳහා)

**05.** **සැලකය යුතු කරුණු**

උපාධි ප්‍රදානෝත්සව ශාලාව ඇතුළත ඡායාරූප ගැනීම තහනම් වන අතර, උත්සව ශාලාව තුළට කැමරා හා ඡායාරූප උපකරණ හෝ බෑග්, ගමන්මලු, පාර්සල් ආදිය හෝ ජංගම දුරකථන ගෙන යාම ද සම්පූර්ණයෙන් තහනම් බව කරුණාවෙන් සලකන්න.

එමෙන්ම උත්සව ශාලාව තුළට වයස අවුරුදු 12 න් පහළ ළමුන් ඇතුළු කිරීමට ද අවසර නොමැති බව අවධාරණය කරනු කැමැත්තෙමි.

මෙම උපාධි ප්‍රදානෝත්සවයට සහභාගීවන ලෙසට ඔබට මෙයින් ආරාධනා කරන අතර උපාධි ප්‍රදානෝත්සවය සාර්ථක කර ගැනීම සඳහා ඔබගේ කාරුණික සහයෝගය හුදෙක් ම අපේක්ෂා කරනු ලැබේ. උපාධි ප්‍රදානෝත්සවයට පැමිණීමේ දී මෙම ලිපිය රැගෙන ඒම අත්‍යවශ්‍ය බව කරුණාවෙන් සළකන්න.

**මහාචාර්ය අමිල බී. සිරිසේන**
**අධ්‍යක්ෂක**
**දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය**


දුරකථනය தொலைபேசி Telephone
General 041 22 27001-4 Ext. 2155
Director 041 22 23133

ෆැක්ස් பக்ஸ் Fax
041 22 23133

ඊ මේල් மின்னஞ்சல் E-mail
dceu@admin.ruh.ac.lk.

වෙබ් අඩවිය இணையத்தளம் Web
www.ruh.ac.lk